## මාධ්‍ය නිවේදනය

## SRI LANKA NEXT - 2018 'නීල හරිත යුගයක්' - ජනාධිපති පරිසර සම්මාන උළෙල, ප්‍රදර්ශනය සහ සම්මන්ත්‍රණ මාලාව

### හැඳින්වීම හා පසුබිම

දේශගුණික විපර්යාසවල බලපෑම වර්තමානයේ මිනිසා ඇතුළු මිහිතලවාසී සියලු ජීවීන් මුහුණපාන ප්‍රධාන අභියෝගයකි. ගෝලීය ජනගහනය වර්ධනය වීමත් සමග ඊට සමගාමීව මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමේ අපේක්ෂාවෙන් සිදුකරනු ලබන මිනිස් ක්‍රියාකාරකම් හේතුකොට ගෙන හරිතාගාර වායු ඉතා විශාල ප්‍රමාණයක් වායුගෝලයට මුදා හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගෝලීය උෂ්ණත්වය ඉහළයාම සිදුවෙමින් පවතී.එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවිය හැකි දේශගුණික විපර්යාස හේතුවෙන් කෘෂිකර්මාන්තය,මානව සෞඛ්‍ය ,ජෛව විවිධත්වය,ජල සම්පත,සාගර සම්පත ආදි ක්ෂේත්‍ර දැඩි බලපෑමට ලක්ව ඇත.

කාර්මීකරණයට පෙර එනම් 1880 වන විට වායුගෝලය කොටස් මිලියනයකට තිබූ කාබන්ඩයොක්සයිඩ් කොටස් ප්‍රමාණය 280ක් වන අතර එය මේ වන විට 400ක් දක්වා වැඩි වී තිබේ. ඒ අනුව මෙම සියවස අවසන් වීමට පෙර ගෝලීය උෂ්ණත්වය $2C^0$ කට වඩා වැඩිවීමට නියමිත බවට විද්‍යාඥයෝ අනතුරු හඟවති. උත්තර සහ දක්ෂිණ ධ්‍රැවයේ අයිස් කඳු දියවීම, වර්ෂාපතන රටාවන් වෙනස්වීම, දිගුකාලීන නියං තත්ව ,නාය යෑම්, ජල ගැලීම් ආදී ව්‍යසන රැසකට මෙම තත්වය හේතු වේ.

මේ අනුව 2015 වසරේ පැරිස් නුවරදී එක්සත් ජාතීන්ගේ ලෝක දේශගුණික විපර්යාස පිළිබඳ වූ ලෝක නායක සමුළුවේදී ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම $2C^0$ කට අඩු ප්‍රමාණයකින් පවත්වා ගත යුතු බව තීරණය කෙරිණි. ශ්‍රී ලංකාවද ගෝලීය උෂ්ණත්වය අවම කිරීමේ ක්‍රියාවලියේදී නියමුවකු ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව මෙහිදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පැවසීය.

එබැවින් බලශක්ති නිෂ්පාදනය, ප්‍රවාහනය, කෘෂිකර්මාන්තය හා අනෙකුත් කර්මාන්තයන් ඇතුළු සියලු ක්ෂේත්‍රවල තිරසාර සංවර්ධනය නීලහරිත සංවර්ධන උපාය මාර්ගික දිශානතියකට අනුගත කිරීමේ උදාර අරමුණෙන් අතිගරු ජනාධිපතිතුමාගේ නීලහරිත සංකල්පයට අනුව මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනවල සංවිධානයෙන් SRI LANKA NEXT - 2018 ප්‍රදර්ශනය සහ සම්මන්ත්‍රණ මාලාව ඔක්තෝම්බර් 19 ,20 දෙදින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පැවැත්වෙන අතර එහි සමාරම්භක උළෙල සහ ජනාධිපති පරිසර සම්මාන ප්‍රදානෝත්සවය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඔක්තොම්බර් 19 වන දින පෙ.ව 10.00ට ආරම්භ වේ.

### ඉලක්කය

නීල හරිත ආර්ථිකයක් තුළින් තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීම.

## වැඩසටහනේ අරමුණු

- දේශගුණික විපර්යාසවල බලපෑම් සම්බන්ධව දේශීය ,කලාපීය හා ගෝලීය වශයෙන් පවතින යාවත්කාලීන තොරතුරු රැස්කිරීම සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාමාර්ග සඳහා එම තොරතුරු බෙදාහැරීම.
- නීල හරිත ආර්ථිකයක් සම්බන්ධව ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර සහ සාමාන්‍ය ජනතාව අතර දැනුවත්භාවය ඇතිකිරීම හා ඔවුන්ගේ සක්‍රීය සහභාගීත්වය ශ්‍රී ලංකාවේ පාරිසරික හා ආර්ථික තිරසාර භාවය සඳහා ලබාගැනීම.
- තිරසාර සංවර්ධනය උදෙසා නිර්මාණශීලීව පරිසර සංරක්ෂණය මගින් දායකත්වය දක්වන ප්‍රමුඛයන් ඇගයීම හා දිරිගැන්වීම.
- දේශගුණික විපර්යාසයන් අවම කිරිම සම්බන්ධව ජාතික වශයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම හා හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට උනන්දු කිරීම.
- බහුපාර්ශ්වීය ගිවිසුම් සම්බන්ධව ජාතියක් වශයෙන් අප සතු දායකත්වය විදහා දැක්වීම .

## 'නීල හරිත යුගයක්' තේමාව යටතේ 'SRI LANKA NEXT - 2018' හි ක්‍රියාත්මක වැඩසටහන්

- ජනාධිපති පරිසර සම්මාන උළෙල
- දේශගුණික විපර්යාස පිළිබඳ මාධ්‍ය සම්මන්ත්‍රණය
- දේශගුණික විපර්යාස පිළිබඳ පර්යේෂණ සමුළුව
- දේශගුණික විපර්යාස පිළිබඳ තරුණ සමුළුව
- ඛනිජ සම්පත් පිළිබඳ දෙවන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව
- සමුද්‍රීය පරිසරය පිළිබඳ සිව්වන ජාතික පර්යේෂණ සමුළුව
- වන සම්පත් පිළිබඳ ජාතික පර්යේෂණ සමුළුව
- පරිසර හිතකාමී නිෂ්පාදන ප්‍රදර්ශනය
- කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුව
- ''සොබා වලන සිතුවම්'' කෙටි චිත්‍රපට උළෙල
- පාසැල් සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්
- පරිසර චිත්‍රපට ප්‍රදර්ශනය

පොලිතින් තහනමත් සමඟ පරිසර හිතකාමී නිෂ්පාදන වලට විශාල ඉල්ලුමක් හිමි වි ඇති අතර එම නව නිෂ්පාදන සහ නිෂ්පාදකයන් හඳුන්වා දීමත් මෙහිදී සිදු වේ.